**රාජ්‍ය භාෂා කොමිෂන් සභාව - 2023**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාවේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 49 වගන්තිය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම අයත් වන වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, පිරිවැය රු.6,234,004 ක් වූ කාර්යාල ලී බඩු අතරින් රු.70,000ක් වූ කබඩ් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබූ අතර, මුළු පිරිවැය රු.882,655 ක් වූ කාර්යාල උපකරණ අතරින් රු.8,850ක් වූ ස්කෑන් යන්ත්‍රය පමණක් පසුගිය වර්ෂයේ ප්‍රත්‍යාගණනය කිරීම සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව සම්පූර්ණයෙන්ම ක්ෂය වී අවසන් වත්කම් ඇතුළත් වන වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු 2024 වර්ෂයේ ආරම්භ කර ඇති බැවින් 2024 මූල්‍ය ප්‍රකාශන තුළින් එය නිවැරදි කළ හැකි බව. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවලට ගළපා තිබූ ක්ෂය වටිනාකම රු.3,994,537 ක් වුවද, විගණනයේදී ගණනය කිරීම් අනුව ක්ෂය වටිනාකම රු.3,306,501 ක් වුයෙන් මූල්‍ය ප්‍රකාශනවල ක්ෂයවීම් රු.688,036 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු පිරිවැය රු2,500,600 ක් වූ පරිගණක වටිනාකමෙන් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ රු.1,376,850 ක පරිගණක වටිනාකම ඉවත් කර ක්ෂය ගණනය කරනු වෙනුවට එම වටිනාකම එකතු කර ක්ෂය ගණනය කිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට පරිගණකවල සමුච්චිත ක්ෂය වටිනාකම රු.3,085,245 ක් වූ අතර පිරිවැය රු.2,500,600 ක් වුයෙන් පරිගණකවල වටිනාකම සෘණ අගයක් නිරීක්ෂණය විය. | වර්ෂයට අදාළ පරිගණක ක්ෂය ගණනය කිරීමේ දී සිදු වූ අතපසු වීමකින් රු.688,425.00 කින් වැඩි වී ඇති බවත් එය 2024 මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ක්ෂය ගණනය කළ යුතුය. |
| (ආ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 20 වන වගන්තිය අනුව පාරිතෝෂික වෙන්කිරීම් ගණනය කිරීමේදී ගණන් නොගත යුතු දුරකථන දීමනාව, භාෂා දීමනාව හා විධායක දීමනාව ඇතුළත්ව ගණනය කර තිබුණ අතර ස්ථිර සේවකයන් තුන්දෙනෙකු සඳහා පාරිතෝෂික වෙන් කිරීම සිදු කර නොතිබුණි. එම වැඩියෙන් හා අඩුවෙන් වෙන් කිරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂිත වෙන් කිරීම රු.182,345ක් අඩුවෙන් සිදුකර තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන තුළින් අඩුවෙන් ගණනය කරන ලද රු.182,345.00 නිවැරදි කිරිමටත් ඉදිරියේ දී පාරිතෝෂික ගණනය කිරීම් පනතේ දක්වා ඇති පරිදි පාරිතෝෂික වෙන්කිරීම් ගණනය කරන ලෙසත් අදාල නිළධාරීන්ට උපදෙස් ලබාදුන් බව. | පනතට අනුව පාරිතෝෂික නිවැරදිව ගණනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතියෙන් ලද වත්කම් අයිතම 15ක් හා නවෝත්පාදන මධ්‍යස්ථානයෙන් ලද ටැබ් පරිගණක 05 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | එම අයිතම පරිත්‍යාග වශයෙන් ලැබී ඇති අතර මේ වන විට එම වත්කම් පරිත්‍යාග ලේඛනයට, ඉන්වෙන්ට්‍රි ලේඛනයට සහ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර ඇති අතර ඒවායේ තක්සේරු වටිනාකම් ලද පසු 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත්කර ගන්නා බව. | වත්කම් වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද මුදලින් රු.832,846ක් පුනරාවර්තන වියදම් සඳහා යොදාගෙන තිබුණි. | මෙම කොමිෂන් සභාව රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් බැවින් භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් ඉතිරිවීම් වර්ෂ අවසානයේ ආපසු භාණ්ඩාගාරය වෙත යැවීම සිදු කළ නොහැකි බවත් සඳහන් කරමි. එබැවින් එම මුදල් අනෙකුත් අත්‍යාවශ්‍ය පුනරාවර්තන වියදම් සඳහා යොදාගෙන අක් මුදල් කළමනාකරණය කරගත් බව. | ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් සඳහා යොදා නොගත යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ13(3) වගන්තිය | සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා වුවද, ඔහු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු නොවිය යුතු වුවත් 2023 මාර්තු 13 දින සිට 2023 ඔක්තෝම්බර් 26 දක්වා කොමිසම් සභාවේ සියළු ගෙවීම් සඳහා වියදම් සහතික කිරීම සභාපතිවරයා විසින් සිදු කර තිබුණි. | කොමිෂන් සභා පනතේ 13.1 පිළිබඳව මවිසින් දැඩි අවධානය යොමුකර කොමිෂන් සභාවේ සියළු ගෙවීම් සඳහා අදාළ කාර්යයන් ද බාධාවක් වීම වළක්වා ගැනීම මාගේ වගකීමට යටත්ව ඉහත කී අයුරින් කාර්ය පටිපාටිමය දෝෂයක් සිදු වී ඇති බව පෙනී යයි. | පනතට අනුකූලව කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) 2022 අප්‍රේල් 26 දිනැති අංක 3/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ජාතික අයවැය චක්‍රලේඛයට අනුව රජයේ කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම නැවැත්විය යුතු වුවද කොමිසම විසින් වාර්ෂික රු.7,284,000 ක බදු මුදලකට කාර්යාල ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණි. | කාර්ය මණ්ඩලය අඩුවන විට නැවත කොමිෂන් සභාව වෙනත් ස්ථානයකට රැගෙනයාම ආර්ථිකමය වශයෙන් වාසිදායක නොවන අතර මෙයට හේතුව වන්නේ කාර්යාලය සකස්කර ගැනීම (කාර්යාල බෙදීම් සඳහා) වෙනුවෙන් දැනටමත් කොමිෂන් සභාවේ ප්‍රතිපාදන වැයකර තිබීමයි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,218,396 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.9,548,362 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,329,966 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන රු. 6,505,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පසුගිය වර්ෂයේ නොගෙවූ රු.1,563,402 ක ගොඩනැගිලි නඩත්තු වියදම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ ලැබී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් එම ගෙවීම සිදු කරගත නොහැකි වූ බව දන්වන අතර සැලසී ඇති ප්‍රතිපාදන තුළින්, එම මුදල කොටස් වශයෙන් ගෙවීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු වියදම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ ප්‍රධාන මෙහෙවර රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් විමර්ෂණය, අධීක්ෂණය, අධ්‍යාපනය හා උපදේශනය මගින් ජනතාවගේ ද්විභාෂා අවශ්‍යතාවය සැපයිම වුවත් අනුමත කාර්ය මණ්ඩලයක් එම කාර්යය සඳහා නිපුන නිලධාරී තනතුරු වන භාෂා නිලධාරි, භාෂා ප්‍රවර්ධන හා විමර්ශන නිලධාරී යන තනතුරුවල පිළිවෙලින් පුරප්පාඩු 02, 07, 03 ක් ලෙස පැවතුණි. | මේ සම්බන්ධයෙන් 2024/03/13 දින රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) සමඟ සාකච්ඡා කරන ලදී. එහි දී ලබාදෙන ලද උපදෙස් අනුව බඳවා ගැනීමට අවශ්‍ය තනතුරු සඳහා කොමිෂන් සභා පත්‍රිකාවක් 2024/03/19 දින කොමිෂන් සභා රැස්වීම සඳහා ඉදිරිපත්කර අනුමැතිය ලබාගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත්කර ඇත. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීම හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |